# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පහත දක්වා තිබෙන තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පාර්ලිමේන්තු කථා පරිවර්තක තනතුර (ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි)
2. පාර්ලිමේන්තු කථා පරිවර්තක තනතුර (සිංහල/ දෙමළ/ සිංහල)

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමග 2018 අගෝස්තු මස 09 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. තමන් අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබාගත හැකි ය).

1. *වැටුප් පරිමාණය :*

   2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 47,340 -3 x 755/13 x 1,030 - රු. 62,995 /- වේ. එබැවින්, පත්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉහත චක්‍රලේඛයේ උපලේඛන II අනුව රු. 37,558 /= ක් වන මාසික වැටුප් පියවරෙහි පිහිටුවා වැටුප් ගෙවනු ලැබේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 75,000.00 පමණ වේ.)

2. *වයස් සීමාව :*

   අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. *අධ්‍යාපන සුදුසුකම් :*

   පහත සඳහන් (අ), (ආ) සහ (ඇ) යටතේ සඳහන් කවර ආකාරයකට හෝ අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද සපුරා ඇති අයදුම්කරුවන් හට ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්කළ හැකිය.

   (අ) ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව විෂයයක් ලෙස පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම සහ උපාධිය සඳහා හදාරා නොමැති භාෂාවට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග යේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබීමත් සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට සිංහල හෝ දෙමළ භාෂාව විෂයයක් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම සහ උපාධිය සඳහා හදාරා නොමැති භාෂාවට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

   හෝ

   (ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී (පැරණි නිර්දේශය) එකවර විෂයයන් 04ක් සමත් වී තිබීම හෝ නව නිර්දේශය යටතේ එකවර විෂයයන් 03ක් සමත් වී තිබීම සහ ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දෙක සඳහා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග යේදී සම්මාන සාමාර්ථ ලබා තිබීමත් සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට සිංහල සහ දෙමළ භාෂා දෙක සඳහා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන සාමාර්ථ ලබා තිබීම.

   සහ

   ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට දෙමළ / ඉංග්‍රීසි භාෂාවට අදාළව හෝ සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට සිංහල / දෙමළ භාෂාවට අදාළව ගුරු වෘත්තීය හෝ කථා පරිවර්තනය / භාෂා පරිවර්තනය හෝ ජන සන්නිවේදනය වැනි ක්ෂේත්‍රයක වසර දෙකකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

   (ඇ) ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන් සඳහා දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දෙමළ / ඉංග්‍රීසි භාෂණ පරිවර්තක හෝ භාෂා පරිවර්තක ස්ථිර තනතුරක් දරන අයෙකු වීම සහ එම තනතුරේ වසර 5ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හෝ සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන් සඳහා දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දෙමළ / සිංහල භාෂණ පරිවර්තක හෝ භාෂා පරිවර්තක ස්ථිර තනතුරක් දරන අයෙකු වීම සහ එම තනතුරේ වසර 5ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

4. *බඳවා ගැනීමේ ක්‍රමය :*

   ක්ෂණික කථා පරිවර්තන හා භාෂා පරිවර්තනය පිළිබඳ පරීක්ෂණ සහ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

   සටහන : ඉහත 3 (අ), (ආ) හෝ (ඇ) යටතේ සුදුසුකම් සපුරා ඇති ඉංග්‍රීසි/ දෙමළ/ ඉංග්‍රීසි කථා පරිවර්තක තනතුර සඳහා

අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට දෙමළ භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවටත් ඉංග්‍රීසි භාෂාවෙන් දෙමළ භාෂාවටත් සමගාමීව කථා පරිවර්තනය කිරීමේ හැකියාව තිබීම අවශ්‍ය වන අතර සිංහල/ දෙමළ/ සිංහල කථා පරිවර්තක තනතුර සඳහා අයදුම්කර තිබෙන අයදුම්කරුවන්ට සිංහල භාෂාවෙන් දෙමළ භාෂාවටත් දෙමළ භාෂාවෙන් සිංහල භාෂාවටත් සමගාමීව කථා පරිවර්තනය කිරීමේ හැකියාව තිබීම අවශ්‍ය වේ. සමගාමී කථා පරිවර්තනය පිළිබඳ සේවා පළපුරුද්දක් අත්‍යාවශ්‍ය නොවේ.

5. *සේවයේ නියුක්ත කරවීමේ නියමයන් හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මුලින්ම වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, සේවයෙහි ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන්, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතු ය. ඔවුන් වෛද්‍ය පරීක්ෂණයකට ද භාජනය විය යුතු ය.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන් පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

6. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඇ) වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික,
(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික.

7. රාජ්‍ය/ පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන්, සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතු ය.

8. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුරු සඳහා නුසුදුසුකමක් වනු ඇත.

9. අයදුම් පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරැදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

10. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් හරහා එවනු නො ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඩබ්ලිව්. බී. ඩී. දසනායක,
පාර්ලිමේන්තුවේ මහ ලේකම්,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.
2018 ජූලි මස 13 වැනි දින.